සාමාන්‍ය සමය විසි අටවන ඉරුදින | **දේව ප්‍රකාශන** | **13-10-13**

## පළමුවන කියැවීම

2 රාජාවලිය 5:14-17

රාජාවලිය දෙවන පොතෙන් ගත් කොටසකි.

**''ඉශ්රායෙලයේ දෙවියන් වහන්සේ මිස වෙන කිසි දෙවි කෙනෙකුන් නැති බව දනිමි.''**

එවිට නාමන් බැස ගොස් දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයාගේ කීම ලෙස ජෝර්දාන් ගඟෙහි සත් වරක් ගිලී ස්නානය කෙළේ ය. ඔහුගේ ශරීරය ද කුඩා ළමයෙකුගේ ශරීරය මෙන් පවිත්‍ර විය. එවිට ඔහු තමාගේ මුළු පිරිවර සමඟ දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයා වෙතට හැරී අවුත්, ඔහු ඉදිරියේ සිට කතා කොට, ''ඉතින් ඉශ්රායෙල්හි සිටින දෙවියන් වහන්සේ මිස මුළු පොළොවේ වෙන දෙවි කෙනෙකුන් නැති බව දැන් මම දනිමි. එබැවින් දැන් ඔබේ මෙහෙකරුවාගෙන් තෑගි පිළිගත මැනවැ''යි කී ය. එලිෂා ද කතා කරමින්, ''මා සේවය කරන ජීවමාන සමිඳාණන් වහන්සේගේ නාමයෙන් මම කිසිවක් නොපිළිගනිමි''යි දිවුරමින් කීවේ ය. එවිට ඔහු එය පිළිගන්න හැටියට ඔහුට පෙරැත්ත කෙළේ ය. එහෙත්, ඔහු අකමැති විය. එවිට නාමන්, ''එසේ නැත්නම්, කොටළුවන් දෙන්නෙකුට ගෙන යත හැකි බරට පස් වත් ඔබේ මෙහෙකරුවාට ලැබේ වා. මන්ද, මින් මතු ඔබේ මෙහෙකරුවා සමිඳාණන් වහන්සේට මිස වෙන දෙවිවරුන්ට දවන යාග පූජාවක් වත්, යාගයක් වත් ඔප්පු කරන්නේ නැත''යි කීවේ ය.

දේව වාක්‍යය එසේ ය. — දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98:1-4

පිළිතුර: සමිඳාණෝ සිය විමුක්ති බලය එළිදරව් කළ සේක.

ගීය: සමිඳුන්ට නව ගීයක් ගයන්නඃ මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක. සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක. සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.
විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක. එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත්, විශ්වාසවන්තකමත් සිහි කළ සේක.

මිහි පිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝ ය. එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්නඃ ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

## දෙවන කියැවීම

2 තිමෝති 2:8-13

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමාට ලියන ලද දෙවන හසුනෙන් ගත් කොටසකි.

**''අපි ස්ථිර ව සිටිමු නම්, උන් වහන්සේ සමඟ රජකම් කරන්නෙමු.''**

මාගේ සුබ අස්නේ තේමාව නම්ඃ ''දාවිත්ගේ වංශයෙන් උපන්, මරණයෙන් උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය.'' අපරාධකරුවෙකු මෙන් යදමින් බඳිනු ලැබ දුක් විඳින්නට මට සිදු වී තිබෙන්නේ ඒ නිසා ය. එහෙත් දේව වාක්‍යය, බැඳ තැබිය නොහැකි ය. එබැවින් තෝරා ගත් අයට ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළින් වන ගැළවීමත්, ඒ සමඟ ම වූ සදාතන මහිමයත් ලැබෙන සේ ඔවුන් නිසා සියල්ල ඉවසමි. පහත දැක්වෙන්නේ විශ්වාස කටයුතු කීමක් ය. ''අපි උන් වහන්සේ සමඟ මැරෙමු නම්, අපි උන් වහන්සේ සමඟ ජීවත් වන්නෙමුඃ අපි ස්ථිර ව සිටිමු නම්,

උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමු අපි උන්වහන්සේ ප්‍රතික්ෂේප කරමු නම්, උන්වහන්සේ අපත් ප්‍රතික්ෂේප කරන සේක. අප අවිශ්වාසවන්ත වුවත්, උන් වහන්සේ විශ්වාසවන්ත ව, සිටින සේක. මන්ද, උන් වහන්සේට තමන් ම ප්‍රතික්ෂේප කිරීම නොකළ හැකි ය.''

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** 1 තෙසලෝනික 5:18

ආලේලූයා ! ආලේලූයා !
සියල්ලෙහි දී ස්තුතී දෙන්න.
කිතුණුවන් වශයෙන් දෙවියන් වහන්සේ
අපෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ.
ආලේලූයා !

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 17:11-19

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**''මේ විජාතිකයා හැර, දෙවියන් වහන්සේට ගෞරව කරන පිණිස වෙන කිසිවෙක් හැරී ආවේ නැද්ද?''**

ජේසුස් වහන්සේ ජෙරුසලම බලා යද්දී, සමාරිය හා ගලීලය මැදින් ගමන් ගත් සේක. උන් වහන්සේ එක් ගමකට ඇතුළු වූ කල, ලාදුරු රෝගීහු දස දෙනෙක් උන් වහන්සේට හමු වූ හ. ඔව්හු දුරින් සිට, ''ජේසුස් වහන්ස, ආචාරීනි, අපට කරුණා කළ මැනවැ''යි හඬ නඟා කී හ. උන් වහන්සේ ඔවුන් දැක, ''ඔබ ගොස් පූජකවරුන් අබිමුවෙහි පෙනී සිටින්නැ''යි වදාළ සේක. ඔව්හු එසේ යද්දී පවිත්‍ර වූ හ. ඔවුන්ගෙන් එක් කෙනෙක් තමා සුව වූ බව දැක, මහ හඬින් දෙවියන් වහන්සේට ගෞරව කරමින් පෙරළා අවුත්, උන් වහන්සේගේ පාමුල වැඳ වැටී උන් වහන්සේට ස්තුති කෙළේ ය. ඔහු වනාහි සමාරිය ජාතිකයෙකි. ජේසුස් වහන්සේ කතා කරමින්, ''දහ දෙනෙක් ම පවිත්‍ර වූවා නොවේ ද? අනෙක් නව දෙනා කොහේ ද? මේ විජාතිකයා හැර, දෙවියන් වහන්සේට ගෞරව කරන පිණිස වෙන කිසිවෙක් හැරී ආවේ නැද් ද'' කියා, ඔහුට කතා කොට, ''නැඟිට යන්න, ඔබේ ශ්‍රද්ධාව ඔබ සුව කෙළේ ය''යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.
ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.